# තේ වැවිලිකරු මුහුණපාන ගැටලු පිළිබඳ අධ්‍යයනයක් (මාතර දිස්ත්‍රික්කයේ දෙනියාය ප්‍රදේශය ඇසුරින්)

ආර්. ඩී. චතුරංග[1]

## සංක්ෂේපය

තේ දල්ල ගසෙන් වෙන්කර ගන්නා අවස්ථාවේ සිට එය කර්මාන්ත ශාලාවට ගෙන ගොස් භාර දෙන අවස්ථාව දක්වා තේ හිමියන්ට විවිධ ගැටලු වලට මුහුණ පෑමට සිදුවේ. එමෙන්ම වත්මන් දේශගුණික තත්වයද මේ සඳහා විශාල බලපෑමක් කරනු ලබයි. මෙසේ විවිධ කරුණු හේතුවෙන් බෙහෝ තේ හිමියන් තේ වගාවෙන් ඉවත් වී වෙනත් වැවිලි වගාවන් කෙරේ යොමුවනු දැකිය හැකිය. මේ හේතුවෙන් තේ වගාව තුළින් ඉවත් වී ඔවුන් වෙනත් වැවිලි කෙරේ අවධානය යොමු කරන්නේ කුමන සාධක මතද යන්න සොයා බැලීම මූලික අරමුණු විය. ඒ අනුව 2016 සැප්තැම්බර් මාසයේ මාතර දිස්ත්‍රික්කයේ දෙනියාය ප්‍රදේශයේ කොටපොල ග්‍රාමයේ තේ ඉඩම් හිමි වැවිලි කරුවන් 50 දෙනෙකු සසම්භාවී ලෙස තෝරා ගනිමින් ප්‍රශ්නාවලි ක්‍රමය හා ඇලැන්වැලිය, සමූපාකාර හා යෝල්ටා යන තේ කර්මාන්තශාලා හරහා ලබාදෙනු ලැබූ ද්වීතික දත්ත මුලාශ්‍ර ඇසුරින් දත්ත ලබා ගැණිනි. මෙම දත්ත ප්‍රමාණාත්මක විශ්ලේෂණ ක්‍රම ඔස්සේ විශ්ලේෂණ කර ඇති අතර ලබාගත් ප්‍රතිඵල වලට අනුව නියැදියෙන් බහුතරයක් ඉඩම් අක්කර 0-2 ත් අතර හිමිකරුවන් බවත් 80% ක් පමණක් සින්නක්කර ඉඩම් හිමියන් බවත් ඉතිරි 20% බදු ඉඩම් බවත් 85%ක්ම රජය විසින් ගෙනෙන ලද පොහොර සහනාධාරය අත් විඳින බවත් නියැදියෙන් 70% ක්ම තේ වගාව පමණක් කරන අතර ඉතිරි 30% තේ වගාවට අමතරව කුරුඳු, ගම්මිරිස්, කරාබුනැටි ආදිය ද වගාකරන බවත් පැහැදිලිය. තවද ඉහත 30%න්, 50%ක්ම පෙරදී කරන ලද්දේ තේ වගාව පමණක් බවත් විවිධ ගැටලුකාරී තත්ත්ව හේතු කොටගෙන වෙනත් වැවිලි වගාවන් සඳහා යොමු වී ඇත. තවද ඉතිරි වැවිලි කරුවන් 70% න් 75% ක්ම තේ වගාවෙන් ලැබෙන ආදායමෙන් තෘප්තිමත් නොවන බවත් අනාගතයේ වෙනත් බෝග වගාවන් කෙරේ යොමු වීමට අදහස් කරයි. තවද තේ කර්මාන්කශාලා මගින් ලබාගත් තොරතුරුවලට අනුව වසරකදී ලැබෙන තේ දළු ප්‍රමාණය 2014 වසරට වඩා 2015 වසරේ 13% කින් පහළ බැස ඇති බවත් නමුත් තේ මිලෙහි ඉහළ දැමීමක් සිදු වී නැති බවත් ය. මේ අනුව තේ වගාවෙන් වෙනත් වගා කෙරේ වැවිලි කරුවන් යොමු වීමට තේ දළු සඳහා ප්‍රමාණවත් මිලක් නොලැබීම, ප්‍රමාණවත් අකාරයට රජයේ මැදිහත්වීමක් නැතිවීම, වසරේ වැඩි කාලයක් පවතින නියඟ තත්ත්වය හා කම්කරුවන්ගේ හිඟයද බලපා ඇති බව මෙයින් අනාවරණය විය. ඒ අනුව තේ වගාවේ උන්නතිය කෙරේ රජයේ මැදිහත් වීම වැඩි කර ගුණාත්මක පොහොර හා ණය ලබාදෙමින් ජල සැපයුම් ක්‍රියාවලියක් ලබා දෙමින් තේ මිලෙහි ඉහළ දැමීම හා කම්කරු වැටුප ඉහළ නැගීම මගින් තේ වගාවේ පසුබෑම වලක්වාගත හැක.

**මුඛ්‍ය පද :** තේ වගාව, පවතින ගැටලු, වගාවේ උන්නතිය

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය,
dinuchathuranga1992@gmail.com